“අල්ලාහ්ගේ සීමාවන් තුළ ස්ථාවරව සිටින්නාට හා එහි වැටෙන්නාට උපමාව නැවක (ස්ථානයක් සඳහා) කුසපත් අදින පිරිසක් මෙනි. පසුව ඔවුන්ගෙන් පිරිසක් එහි ඉහළ කොටස ද තවත් පිරිසක් එහි පහළ කොටස ද ලබා ගත්තේය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අන්-නුඃමාන් ඉබ්නු බෂීර් (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී: “අල්ලාහ්ගේ සීමාවන් තුළ ස්ථාවරව සිටින්නාට හා එහි වැටෙන්නාට උපමාව නැවක (ස්ථානයක් සඳහා) කුසපත් අදින පිරිසක් මෙනි. පසුව ඔවුන්ගෙන් පිරිසක් එහි ඉහළ කොටස ද තවත් පිරිසක් එහි පහළ කොටස ද ලබා ගත්තේය. එහි පහළ කොටසේ සිටින්නන් ජලය ලබා ගැනීමට අවශ්ය වූ විට ඉහළ සිටින්නන් වෙත යන්නට ඔවුනට සිදු විය. පසුව ඔවුහු: 'අපට ඉහළින් සිටින්නන්ට කරදර නොකර අපගේ කොටසෙහිම අපි විවරයක් සාදා ගත්තේ නම් මැනව’ යැයි පැවසුවෝය. මොවුන් සිතන පරිදිම කරන්නට ඔවුහු ද මොවුන් අත්හැර දැමුවේ නම්, ඔවුන් සියලු දෙනාම විනාශ වී යනු ඇත.
නමුත් ඔවුහු මොවුන්ගේ අත්වලින් අල්ලාහ් ගත්තේ නම්, ඔවුන් ද දිවි ගලවා ගන්නා අතරම සෙසු සියලු දෙනා ද දිවි ගලවා ගනු ඇත.” [صحيح] [رواه البخاري]

අල්ලාහ්ගේ සීමාවන් තුළ ක්රියා කරන්නන් යනු අල්ලාහ්ගේ නියෝග මත ස්ථාවරව සිටින්නන්ය. යහපත විධානය කොට අයහපතින් වළක්වන්නන් හට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ උපමාවක් ගෙනහැර පෑහ. එමෙන්ම අල්ලාහ්ගේ සීමාවන්ගෙන් ඉවතට වැටෙන්නන් යනු යහපත විධානය කිරීම අත්හැර දමා අයහපත සිදු කරන්නන් හට ද උපමා ගෙන හැර පෑහ. එහි බලපෑම ප්රජාවේ සාර්ථකත්වයයි. එනම් එය නැවක ගමන් කරන පිරිසක් මෙනි. නැවේ ඉහළ මහලේ සිටින්නේ කවුද? එහි පහළ මහලේ සිටින්නේ කවුදැයි තෝරා ගැනීමට ඔවුහු කුසපත් ඇද්දෝය. ඒ අනුව ඔවුන්ගෙන් පිරිසකට ඉහළ මහල ද තවත් පිරිසකට පහළ මහල ද හිමි විය. පහළ මහලේ සිටින්නන් හට ජලය ඇද ගැනීමට අවශ්ය වූ විට, ඔවුනට ඉහළින් සිටින්නන් වෙත යාමට සිදු විය. පහළ මහලේ සිටින අය 'අපට ඉහළින් සිටින්නන් හට කරදර නොකර, අපගේ මේ පහළ ස්ථානයේම විවරයක් සාදා ජලය ලබා ගනිමු' යැයි පැවසුවෝය. ඉහළ සිටින්නන් එය සිදු කරන්නට ඔවුනට ඉඩ දී බලා සිටියේ නම්, නැවත් සමගම ඔවුන් සියලු දෙනාම ගිලී යනු ඇත. මොවුන් ඔවුන් ව එයින් වැළැක්වූයේ නම්, ඔවුන් නතර කළේ නම් දෙපිරිසම මිදෙනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3341